www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අයවැය: දේශපාලන අර්බුදයේ සලකුනක්

## Sri Lankan budget: a sign of political crisis

**කේ. රත්නායක විසිනි**
**2004 නොවැම්බර් 22**

පසුගිය බ්‍රහස්පතින්දා මුදල් ඇමති සරත් අමුනුගම ඉදිරිපත් කල එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවේ ප්‍රථම අයවැය වනාහි බඩු මිල ඉහල යාම සහ ජීවන මට්ටම් කඩා වැටීම පිලිබඳව වැඩ කරන ජනතාව අතර පවත්නා වෛරය පාලනය කර ගැනීමේ මංමුලා සහගත ප්‍රයත්නයකි.

ඊලඟ වසර සඳහා මූල්‍ය සැලසුමක් ලෙස, බොහෝ සෙයින් දේශපාලනික නාටකයක් වූ ජාතිකවාදී පූර්විචානම්වලින් පිරුනු අයවැය කතාව ඉදිරිපත් කිරීමට අමුනුගම පැය හයකට ආසන්න කාලයක් ගත්තේ ය. පැවති ආන්ඩුවේ ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත්වලට එරෙහිව පුලුල්ව පැතුරුනු වෛරය ගසාකමින් මෙම අප්‍රේල් මස පැවති මැතිවරනයෙන් එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) පරාජය කර ඇති එජනිසයට අවදානම් සහිත මාවතක ප්‍රවේශමෙන් ගමන් කිරීමට සිදුව ඇත. එනම්, සාමාන්‍ය කම්කරුවන්ට සීමිත සහන දෙන අතර ම මහ ව්‍යාපාරිකයන්ට හා විදේශ ආයෝජකයන්ට ආයාචනා කිරීමට සැලසුම් කෙරුනු පිලිවෙත් ක්‍රියාවට දැමීම යි.

පාර්ලිමේන්තු සැසි වාරයට පෙරාතුව එජනිස ප්‍රකාශකයන් කියා සිටියේ ආන්ඩුව "දුප්පතුන්ට ලැදි" මෙන් ම "වර්ධන-ලැදි" වන "මහජන-ලැදි අයවැයක්" ඉදිරිපත් කරන බව යි. රට මත පටි තද කර ගැනීමේ පිලිවෙත් පැනවීමෙහි ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව ඉටු කරන ක්‍රියාකලාපය පිලිබඳව පවත්නා මහජන අප්‍රසාදය ගැන හොඳින් දන්නා අමුනුගම පුහු ආඩම්බර ලීලාවෙන් ප්‍රකාශ කලේ අයවැයට පෙරාතුව ජාත්‍යන්තර ඒජන්සි සමග සාකච්ඡා නොපැවැත්වෙන බව යි. මෙය "දේශීයව තැනූ" අයවැයක් වනු ඇතැයි ඔහු පැවසී ය.

අයවැය පූර්විකාව ද එම තේමාව ම ප්‍රකාශයට පත් කරමින්, "දේශීය සාරධර්ම සහ ජාතික ප්‍රමුඛතා මත පදනම් වූ තිරසර ආර්ථික සහ සමාජ සංවර්ධනයක්" පිලිබඳව අවධාරනය කලේ ය. විශේෂයෙන් එජනිසයේ දෙවන විශාලතම හවුල්කරු වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) විසින් තොරොම්බල් කරනු ලබන මෙම ජාතිකවාදී යොමුවෙහි එල්ලය වන්නේ ජාත්‍යන්තර තරඟකාරිත්වය මගින් තදබල ප්‍රහාරයට ලක්ව ඇති සුලු ව්‍යාපාරික හා ගොවි ස්ථරයන් අතර ආන්ඩුවට පවත්නා සහයෝගය ඉහල දමා ගැනීම යි.

කෙසේ වෙතත්, තමන්ගේ දේශීයව තැනූ අයවැය රට ආර්ථික අර්බුදයෙන් ගොඩ ගනු ඇතැයි යනුවෙන් අමුනුගම කරන කියාපෑම ප්‍රෝඩාවකි. ආන්ඩුවේ පිලිවෙත් හැඩගැස්වී ඇත්තේ එහි පාලනයෙන් පිටස්තරව පවත්නා සාධක මගිනි -- එනම්, ලෝක වෙලඳ පොලේ තෙල් මිල ගනන් ඉහල යාම, විදේශ ආයෝජන සඳහා පවත්නා තියුනු වන තරඟය, ජාත්‍යන්තර රෙදිපිලි සහ ඇගලුම් කෝටා ක්‍රමය අවසන් වීම, සහ රටේ විසි අවුරුදු සිවිල් යුද්ධය අවසන් කිරීමේ සාකච්ඡා යලි ආරම්භ කෙරෙන තෙක් ආධාර අත්හිටුවන බවට ආධාර දෙන ප්‍රධාන රටවල් හා ආයතන කරන අවධාරනය යනාදිය යි.

එජනිස ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව සමග ආකාරගත පූර්ව-අයවැය සාකච්ඡා නොපැවැත්වුවා විය හැකි ය. එහෙත් කෙසේ වෙතත් මෙම ආයතන අයවැය ලියවිල්ල හැඩගස්වා ඇත. ජාතිකවාදී වාචාලත්වය කෙසේ වෙතත්, අමුනුගම හොඳින් දැන සිටි කාරනාවක් නම් විදේශ ආයෝජකයන් සහ ආධාර දෙන රටවල් හා ආයතන විරසක කර ගැනීමක් ආන්ඩුවට දැරිය නො හැකි ය යන්න යි. එජාපෙ මෙන් ම, එජනිසයේ ප්‍රධාන පක්ෂය වන ඔහුගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ද 1994 සිය 2001 දක්වා බලයේ සිටි කාල පරිච්ඡේදය තුල දී නිදහස් වෙලඳ පොල ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ක්‍රියාවට දැමී ය.

ග්‍රාමීය ජනගහනයෙන් සියයට 70ක් පසුගිය දශක දෙකේ ආර්ථික වර්ධනයේ වාසි පහලට කාන්දු වීමක් අත් විඳ නැති බව සිය අයවැය කතාවේ දී අමුනුගම පිලිගත්තේ ය. "ඇත්ත වශයෙන් ම, 1980 දී සියයට 21ක් වූ ජනගහනයේ දරිද්‍රතම සියයට 40ට ජාතික ආදායමෙන් හිමි පංගුව 2002 දී සියයට 14 දක්වා තියුනු ලෙස කඩා වැටී ඇත -- එනම්, දුගීන්ගේ ආදායම් පංගුව බේදජනක ලෙස තුනෙන් එකකින් කඩා වැටීමකි. ධනවත් ම සියයට 20හි ආදායම් පංගුව සියයට 54 දක්වා ඉහල නැග තිබේ." යයි ඔහු පැවසී ය.

එජනිස අප්‍රේල් මැතිවරනයෙන් යන්තම් ජයගත් අතර තම ආන්ඩුව දිවි ගෙවන්නේ නයට ගත් කාලයක් තුල ය යන්න පිලිබඳව අමුනුගම සහ කැබිනට් ඇමතිවරු දැනුවත් ය. බඩු මිල ඉහල නැගීම මෙන් ම

සැලසුම් කෙරුනු පුද්ගලීකරනයන් සහ සමාජ සේවාවන් මත තව දුරටත් එල්ල කෙරෙන ප්‍රහාර දුම්රිය, වතුකරය සහ සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍ර යන තන්හි කම්කරුවන්ගේ වර්ජන හා විරෝධතා අවුලුවා ඇත. එබැවින් මහජන සහයෝගය බිඳ වැටීම වලකාගනු වස් පාලක සභාගයට, විශේෂයෙන් ම ජවිපෙට, අයවැය තීරනාත්මකව වැදගත් ය.

මාස තුනක් ඇතුලත රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් සියයට 70කින් වැඩි කිරීමට දුන් පොරොන්දුව ද ඇතුලත්, පොරොන්දු මාලාවක් ම මැතිවරන උද්ඝෝෂනය තුල දී එජනිසය දුන් අතර ඒවා ඉටු කර නැත. පුපුරන සුලු විභවයකින් යුත් මෙම ගැටලුව සමනය කර ගනු වස් උත්සුකව ඇති අමුනුගම, රාජ්‍ය සේවකයන් සඳහා මසකට රුපියල් 3,250 (එ.ජ. ඩොලර් 32) සිට රුපියල් 9,000 දක්වා වූ සියයට 40ක වැටුප් වැඩිවීමක් යෝජනා කලේ ය. මෙම වැටුප් වැඩිවීම පවා ගෙවනු ඇත්තේ අදියර දෙකකිනි -- දෙසැම්බරයේ සිට සියයට 20ක් හෝ අවම වසයෙන් රුපියල් 2,500ක් සහ ඉතිරිය 2006 ජනවාරියේ දී වසයෙනි.

මෙම වැටුප් වැඩිවීම පිහිටුවා ඇත්තේ සේවා කොන්දේසිවලට එල්ල කෙරුනු මූලික ප්‍රහාරයක් මත ය. එනම් මේ වෙන තෙක් ම රාජ්‍ය අංශයේ අනුල්ලංඝනීය දෙයක් ලෙස පැවති පැය අටේ වැඩ දිනයට වල කැපීම යි. අමතර ගෙවීමකින් තොරව වැඩ දිනය පැය අටේ සිට නවය දක්වා පැයකින් දීර්ඝ කිරීමට අයවැය යෝජනා කලේ ය. මෙම පියවර අති කාල ගෙවීම් ඉතිරි කර ගැනීමට පමනක් නොව, "වඩා වැඩි ඵලදායිතාවක්" සඳහා කෙරෙන අමතර ඉල්ලීම්වලට පදනම දැමීමටත් රාජ්‍ය අංශයේ රැකියාවලට තව දුරටත් වල කැපීමටත් තුඩු දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ කම්කරුවන්ගෙන් බහුතරයකට මෙම වැටුප් වැඩිවීම නොලැබෙනු ඇත. මුලු ශ්‍රම බලකායෙන් රාජ්‍ය අංශයේ රැකියාවන්හි නියුතුව සිටින්නේ සියයට 13ක් පමනක් වන අතර පුද්ගලික අංශයේ සියයට 44ක් සේවය කරයි. වැටුප් වැඩිවීම පුද්ගලික අංශයට ද දීර්ඝ කරන ලෙස කියමින් මුදල් ඇමති මූන බේරා ගැනීමේ ආයාචනයක් කල මුත් "ඉල්ලීමට" එකඟ වීමට හාම්පුත්තු කිසිසේත් ම බැඳී නැත. පුද්ගලික අංශයේ විශාලතම ක්ෂේත්‍රය වන තේ හා රබර් වතුකරයේ දෛනික වැටුප් යන්තම් රුපියල් 14කින් නැතහොත් සියයට 11කින් ඉහල දමන වැටුප් ගිවිසුමක් ආන්ඩුව මෑත දී අනුමත කලේ ය.

## සීමිත සහන

උද්ධමනය හේතු කොටගෙන වැටුප් දැනට මත් බරපතල ලෙස බාදනය වී ඇත. එජනිසය බලයට පැමින ගත වූ කෙටි කාලය තුල, නිල ජීවන වියදම් දර්ශකය මාර්තුවේ තිබූ 3,426 සිට ඔක්තෝබරයේ දී 3,699 දක්වා පිම්මේ ඉහල නැග තිබේ. අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ගනන් ඊටත් වඩා තියුනු ලෙස නැග ඇත: හාල් කිලෝග්‍රෑමයක් රුපියල් 30 සිට 50 දක්වා සියයට 66කින් ද තිරිඟු පිටි කිලෝග්‍රෑමයක් රුපියල් 22 සිට 32 දක්වා ද වැඩි වී තිබේ. ඉහල තෙල් මිල ගනන් පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ ගෑස් මිල මෙන් ම ප්‍රවාහන වියදම් ද ඉහල දැමීමට තුඩු දී ඇත.

ඉහල මිල ගනන් පිලිබඳ මහජන වෛරය සංසිඳ වීමේ ප්‍රයත්නයක් ලෙස ආන්ඩුව වටිනාකමට එකතු වන බද්ද (වැට්) පැනවීම සඳහා තරමක් සංකීර්න මට්ටම් තුනක ක්‍රමයක් හඳුන්වා දුනි. එනම්, සීනි, එලවලු සහ කරවල වැනි මූලික භාන්ඩ සඳහා බද්ද සියයට 15 සිට 5 දක්වා පහල දමන අතර තෝරාගත් "සුඛෝපභෝගී" භාන්ඩවලට බදු අනුපාතිකය සියයට 18 දක්වා ඉහල දැමීම යි. එහෙත් මෙම වෙනස්කම් අන්ත දුගීන් අත් විඳින කොන්දේසි සමනය කිරීමෙහි ලා සමත් නො වනු ඇති අතර ම වැටුප් ලබන කම්කරු කොටස්වලට පහර එල්ල කරමින්, "සුඛෝපභෝගී" භාන්ඩ සඳහා වැය කිරීම ඔවුනට වඩාත් අසීරු කාරියක් බවට පත් කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා නිවාස නය ව්‍යාපෘති සීමිතව වැඩි දියුනු කිරීම, සෞඛ්‍ය රක්ෂන ක්‍රම වර්ධනය කිරීම සහ අර්ධ වැටුප් සහිතව හෝ වැටුප් රහිතව මාතෘ නිවාඩු දීර්ඝ කිරීම අයවැයෙහි සෙසු "දුප්පතුන්ට-ලැදි" යෝජනාවලට ඇතුලත් විය. සෞඛ්‍ය හා අධ්‍යාපන අංශ සඳහා අයවැය ප්‍රතිපාදන පිලිවෙලින් සියයට 23කින් හා සියයට 25කින් ඉහල දමා තිබේ. එහෙත් මෙම අංශ දෙක ම පෙර පැවති ආන්ඩු යටතේ වසර ගනනාවක් තිස්සේ ක්‍රියාවට දැමූ වියදම් කප්පාදු මගින් බාදනයට ලක්ව ඇත. දැන් අඩු වැටුප් යටතේ පුහුනු ව්‍යාපෘතියක යෙදී සිටින රැකියා විරහිත උපාධිධාරීන් 42,000කට ද උසස් පෙල සමත් 30,000කට ද ලබන වසරේ රැකියා ලබා දෙන බවට ද අමුනුගම පොරොන්දු විය. සෙසු රැකියා විරහිතයන්ට "ආර්ථික වර්ධනය" තමන්ට රැකියා අවස්ථා ලබා දෙන තෙක් බලා සිටීමට සිදු වනු ඇත.

සුලු හා මධ්‍යම පරිමාන ව්‍යවසායකයන්ට දෙන සීමිත බදු සහන සහ නය පහසුකම් හැරුනු කොට ගොවීන් සහ සුලු ව්‍යාපාරිකයන් සඳහා කිසිවක් ප්‍රදානය කර නැති තරම් ය. නිෂ්පාදන වියදම් ඉහල යාම සහ නය වැඩිවීම මගින් දරුනු ලෙස පහර කා ඇති ගොවීන්ට පවසා ඇත්තේ වැව් 10,000ක් පිලිසකර කිරීමේ සහ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ඇරඹීමේ ආන්ඩුවේ පුරාජේරු සැලසුම් මගින් ඔවුන්ට දියුනු වීමේ අවස්ථාව සැලසෙනු ඇති බව යි.

ඔවුන්ගේ මැතිවරන පොරොන්දු මෙන් ම, ආන්ඩුවේ "දුප්පතුන්ට-ලැදි" අයවැය යෝජනා ද මිථ්‍යාවන් බව ඉක්මනින් ම ඔප්පු විය හැකි ය. යෝජිත වියදම් ඉහල දැමීමේ සැලසුම්වලට පෙරාතුව පවා, ආන්ඩුවේ මූල්‍ය සම්පත් පැවතුනේ අර්බුද තත්වයක ය. අපේක්ෂිත අයවැය හිඟය රුපියල් බිලියන 171කි, එය මුලු වියදමෙන් තුනෙන් එකකට ආසන්න අගයකි. ආන්ඩුව සැලසුම් කරන්නේ විදේශීය නය දෙන්නන් වෙතින් රුපියල් බිලියන 58ක් ලබා ගැනීමට යි. එහෙත් එය

අයවැයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ අනුමැතිය ලැබීම මත රඳා පවතිනු ඇත.

අයවැයට පෙරාතුව ජාත්‍යන්තර ආයතන සමග කිසිඳු සාකච්ඡාවක් නො කරන බවට ප්‍රකාශ කල නමුත් එය ඉදිරිපත් කිරීමෙන් පසුව තමන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව හමුවන බවට අමුනුගම වහා ම මාධ්‍යවලට සහතික විය. ඇත්ත වසයෙන් ම තව දුර ආර්ථික ප්‍රතිව්‍යුහකරන ක්‍රියාවට දමන ලෙස එල්ල කෙරෙන පීඩනයන්ට ආන්ඩුව ක්ෂනිකව ම ලක් වනු ඇත. මෙම ආයතන සතුටු කරනු වස් අමුනුගම පොරොන්දු වී ඇත්තේ මේ වසරේ දී දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.5ක් දක්වා පිම්බුනු ආන්ඩුවේ වියදම් ඊලඟ වසරේ දී දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5 මට්ටමට සීමා කරන බවට යි.

ආර්ථික අටුවාකරුවන් ගනනාවක් ම නිරීක්ෂනය කර ඇති පරිදි, ආන්ඩුව සිය වැඩ පිලිවෙලවල් සඳහා මුදල් සොයා ගැනීමටත් අපේක්ෂිත මූල්‍ය ඉලක්කයන් ජය ගැනීමටත් අවශ්‍ය බදු එකතු කර ගැනීමේ දී බැරෑරුම් අසීරුතාවන්ට මුහුන දෙයි. දශකයක් තිස්සේ ව්‍යාපාරිකයන් හා විදේශ ආයෝජකයන් සඳහා බදු සහන දීමේ ප්‍රතිඵලයක් ලෙස ආන්ඩුවේ ආදායම් දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1995 දී තිබූ සියයට 20.4 සිට 2003 වන විට සියයට 13.2 දක්වා තියුනු ලෙස කඩා වැටී ඇත. ආදායම ඊලඟ වසරේ දී දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17.2ක් දක්වා ද 2008 වන විට එය සියයට 19.5 දක්වා ද ඉහල දැමීමට මැත අයවැයෙන් අපේක්ෂිත ය. එහෙත් මෙම සැලකිය යුතු නැග්ම සාක්ෂාත් කර ගන්ට යන්නේ කෙසේ ද යන වග අයවැයෙන් පැහැදිලි නො කෙරේ.

අයවැය මහ ව්‍යාපාරිකයන්ගෙන් එකතු කෙරෙන බදුවල සැලකිය යුතු වර්ධනයක් පෙර නොදකී. තථ්‍ය වසයෙන් ගත් කල, එය පවත්නා සියයට 15ක ප්‍රාග්ධන ප්‍රතිලාභ බද්ද ඉවත් කොට ඒ වෙනුවට කොටස් වෙලඳ පොලේ ගනුදෙනු මත සියයට 0.2ක බද්දක් හඳුන්වා දීම මගින් ආයෝජකයන්ට දැවැන්ත සහනයක් දී තිබේ. එහෙත් මහ ව්‍යාපාරිකයන් මත බරක් පැටවෙන්නේ නැති නම්, එවිට නොවැලැක්විය හැකි ලෙස ම එහි ආනිශංස විඳිමට සිදු වනු ඇත්තේ සුලු ව්‍යාපාරිකයන්, වෙලෙඳුන්, ගොවීන්, කම්කරුවන් සහ දුගීන්ට ය ඒ එක්කෝ ඉහල බදු බර නැත හොත් ආන්ඩුව සිය පොරොන්දු කඩ කිරීම හේතු කොට ගෙන ය.

කම්කරු පන්තිය මත අයවැය යෝජනා පැටවීමෙහි ලා ප්‍රධාන ක්‍රියාකලාපය පැවරෙනු ඇත්තේ ජවිපෙ මත ය. ජවිපෙ මන්ත්‍රීහු පාර්ලිමේන්තු සැසිය තුල දී අයවැය යෝජනාවන්ට අනුමැතිය පල කරමින් සිය මේසවලට නැවත නැවතත් තඩි බෑවෝ ය. ආන්ඩුවේ පාර්ශ්වයෙන් අයවැය විවාදය ආරම්භ කරමින්, ජවිපෙ වාචාල කථික විමල් වීරවංශ, අයවැය "නව ආර්ථික උපාය මාර්ගයක්" ලෙස හඳුන්වමින් ද එයට විරුද්ධ වන්නන් "උඟරන්" ලෙස හෙලා දකිමින් ද අයවැය මත ප්‍රශංසා වැසි වැස්සවී ය. ඔහුගේ මෙම අදහස් දැක්වීම්, මොන යම් හෝ විවේචනයකට එරෙහිව ඕනෑම දරුනු පියවරක් ගැනීමට ජවිපෙ සූදානම් බවට කෙරුනු අනතුරු ඇඟවීමකි.

දරුනු අතට හැරෙමින් පවතින රටේ ආර්ථිකය ආන්ඩුව මුහුන දෙන අසීරුතා තවත් තීව්‍ර කරනු ඇත. වාර්ෂික තෙල් ආනයන වියදම 2003 දී තිබූ එ.ජ. ඩොලර් මිලියන 837 සිට මේ වසරේ දී ඩොලර් මිලියන 1,600 දක්වා පිම්මේ ඉහල නැග ඇත. රටේ වෙලඳ හිඟය මේ වසරේ මුල් මාසය නවය තුල පමනක් ඩොලර් බිලියන 1.57 දක්වා සියයට 67කින් පුලුල් වී ඇති අතර ආර්ථික වර්ධනය 2003 දී තිබූ සියයට 5.9 සිට මේ වසරේ දී සියයට 5 දක්වා පහල වැටී තිබේ. ඇමරිකානු මුදල යුරෝවට හා යෙන් මුදලට සාපේක්ෂව පල්ලම් බසින තතු යටතේ පවා, ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව එක දිගට ම කඩා වැටෙමින් පවතී.

ආන්ඩුව මුහුන දෙන දේශපාලනික හා මූල්‍ය දුෂ්කරතා ගැන දැනුවත්ව සිටින මහ ව්‍යාපාරිකයෝ පරෙස්සම් සහගතව අයවැය සාදරයෙන් පිලිගෙන ඇති අතර කොලඹ කොටස් වෙලඳ පොලේ සමස්ත කොටස් මිල දර්ශකය 1,485 දක්වා ඒකක 22කින් ඉහල නැංගේ ය. වානිජ මන්ඩලය සම්මේලයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති නවාෂ් රාජාබ්දීන් සුලු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර මත යෙදුනු අවධාරනය ඉච්ඡා සහගත ලෙස ප්‍රශංසාවට ලක් කරමින් එය "සමස්තයක් වසයෙන් ඉතා සතුටුදායක අයවැයක්" යයි පැවසී ය. ලංකා වානිජ මන්ඩලය සහ ජාතික වානිජ මන්ඩලය ද ඊට සමාන අදහස් දක්වා තිබුනි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ජ්‍යෙෂ්ඨ නේවාසික නියෝජිත ජෙරමි කාටර්, අයවැය යෝජනා සාදරයෙන් පිලිගනිමින් "වර්තන වියදම් හේතු කොට ගෙන ඇති වන හිඟය පියවනු පිනිස ප්‍රාග්ධන වියදම් කප්පාදු නො කල යුතු බව" අවධාරනය කලේ ය. මූල්‍ය සැලසුම පිලිබඳ පරිපාලිත විවේචනයක් ලෙස පමනක් අර්ථ දැක්විය හැකි ආකාරයෙන් ඔහු මෙසේ අදහස් දැක්වී ය: "අයවැය යෝජනා සැම විට ම අභිලාෂාත්මක ය. එහෙත් අභියෝගාත්මක කර්තව්‍යය නම් එය ක්‍රියාවට දැමීම හා එහි ඵල ලබා ගැනීම යි." අප්‍රේල් මාසයේ දී අත්හිටුවන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඩොලර් මිලියන 657ක නය ව්‍යාපෘතිය යලි සලකා බැලිය හැකි බවට ඔහු ඇඟවුම් කලේ ය. ඒත් ඒ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම් ඉටු කෙරෙන්නේ නම් පමනකි.

අන් සියල්ලටමත් වඩා මහ ව්‍යාපාරිකයන් උත්සුක වී සිටින්නේ යලි සිවිල් යුද්ධය ඇවිලීමේ අන්තරාය ගැන ය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාම සාකච්ඡා යලි අරඹන බවට පොරොන්දු වන අතර ම, මිලිටරිය යුද සූදානමක දිගට ම තබා ගනු පිනිස ආන්ඩුව ආරක්ෂක වියදම් රුපියල් බිලියන 43 සිට 56 දක්වා ඉහල දමා ඇත. සංගත ප්‍රධානීන් සම්බන්ධයෙන් ගත් කල, යලිත් යුද්ධය ඇවිලීම ආර්ථික ව්‍යසනයක් වන අතර ම, වත්මන්

තත්වය තව දුරටත් දරා ගත නො හැක -- සාකච්ඡා නොපැවත්වීම විදේශ ආධාර ගලා ඒම අත් හිටුවා ඇති අතර ආරක්ෂක වියදම් හේතු කොට ගෙන අත්‍යවශ්‍ය පොදු කාර්ය ව්‍යුහ සඳහා දැරිය යුතු වියදම් අත් හිටුව යි.

සිංගප්පූරුවේ ඇබර්ඩීන් ඇසෙට් මැනේඩ්මන්ට් ඒසියා ලිමිටඩ් ආයතනයේ කලමනාකරුවකු වන ඒද්‍රියන් ලිම්, විදේශ ආයෝජකයන් වෙනුවෙන් කතා කරමින්, කෙලින් ම මෙසේ ප්‍රකාශ කලේ ය: "සාමය බඳුවලට වඩා බලගතු අවියක් විය හැකි ය. . . . අයවැය වැදගත් ය. එහෙත් මා වඩා කැමැත්තෙන් සිටින්නේ සාම ක්‍රියාදාමයේ ප්‍රගතිය දැකීමට ය." ලිම් ජෝන් කීල්ස් හොල්ඩින්ස් ලිමිටඩ් සහ එයිට්කන් ස්පෙන්ස් සමාගම ඇතුලු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඉහල පෙලේ සමාගම් ගනනාවක හවුල්කරුවෙකි.

වැඩ කරන ජනතාව අයවැය සම්බන්ධයෙන් එජනිස ආන්ඩුව සමග ඉක්මනින් ම ගැටුම්වලට එලඹෙනු ඇත. දැනටමත් කම්කරු කොටස් වැඩ පැය ගනන ඉහල දැමීම පුලුල් ලෙස හෙලා දැක එයට එරෙහිව උද්ඝෝෂනය කරමින් සිටී. දැනටමත් ජීවන මට්ටම් කඩා වැටීම පිලිබඳව කෝපයට පත්ව සිටින බොහෝ වැඩ කරන ජනයා ආන්ඩුවේ පොරොන්දු සම්බන්ධයෙන් ගැඹුරින් ම සැක පහල කරති.

© www.wsws.org